**ශ්‍රී ලංකා පදනම - 2015**

-----------------------------

ශ්‍රී ලංකා පදනමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1.** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1.** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනයක් සිදුකර ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම්වල ගැලපිය යුතු වුවත් පිරිවැය රු.82,003,907 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.22,133,444 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පදනමේ ණයගැති ශේෂය රු. 24,219,424 ක් වූ අතර ඉන් රු. 399,578 ක් වූ ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක්ද , රු. 5,421,216 ක් වූ ණය ශේෂ වර්ෂ 1 සිට 4 දක්වා වූ කාලයක්ද අයනොවී පැවතුණි.

(ආ) ආයතනය සතුව පවතින ශ්‍රවණාගාරය, නේවාසිකාගාරය ආහාර සහිතව බාහිර ආයතන වෙත කුලියට ලබාදීමේදී, ඉන්වොයිසියේ සඳහන් මුදලින් සියයට 50 ක් ඉල්ලුම් කරන අවස්ථාවේදී හා ඉතිරිය පහසුකම් ලබාගන්නා දිනයේ දී ගෙවිය යුතු වුවත්, ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේදී ආයතන හා පුද්ගලයන් 16 ක් වෙත ණය පදනම මත පහසුකම් සැලසීම වෙනුවෙන් රු. 1,578,137 ක් ලැබිය යුතුව පැවතුණි.

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104, 108 | වටිනාකම රු. 189,588 ක් වූ " කලර් ප්‍රින්ට් කාට්රිජ්ස්" 20 ක් සම්බන්ධයෙන් සිදු වූ පාඩුව මුදල් රෙගුලාසිවලට පටහැනිව පොත්වලින් කපා හැර තිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 10 වන වගන්තිය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව, ආපදා ණය ගෙවීමේදී මාස 10 ක මූලික වැටුප රු. 250,000 ක උපරිමයකට යටත්ව ගෙවිය හැකි වුවද එම සීමාව නොසලකා නිළධාරීන් 08 දෙනෙකු සඳහා රු.250,000 සිට රු. 721,095 ක් දක්වා පරාසයක එකතුව රු.2,796,061 ක් ආපදා ණය වශයෙන් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,205,810 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,376,078 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,581,888 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් රු. 13,045,289 කින් අඩු වීම හා සේවක පාරිශ්‍රමික රු. 10,667,145 කින් වැඩි වීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.11,380,440 ක අතිරික්තයක් පැවතියද 2012 වර්ෂයේදී එය රු. 4,083,994 ක ඌනතාවයක් බවට පත් වී තිබුණි. 2013 වර්ෂයේ දී නැවත අතිරික්තයක් බවට පත්වූ අතර 2014 වර්ෂයේදී එම අතිරික්තය තවදුරටත් වර්ධනය වී තිබුණද, 2015 වර්ෂයේදී එය රු.16,205,810 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ රු.85,703,420 ක් වූ දායකත්වය 2014 වර්ෂය දක්වාම අඛණ්ඩව වර්ධනය වී තිබුණ ද 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී එය රු.10,151,864 කින් පිරිහීම හේතුවෙන් රු.112,879,959 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනතේ 5 වන වගන්තිය පරිදි ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය පිළිබඳ අවබෝධය හා විශ්වාසය නඟා සිටුවීම හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමද, සියළු පුද්ගලයන්ගේ මූලික නිදහස පිළිපැදීමෙහි ලා අන්තර් ජාතික අවබෝධය හා සහයෝගය ලබා දීම තුළින් විශ්ව ගෞරවය නගා සිටුවීමද, පොදු ජනයාට සමාජ ප්‍රගතිය පිළිබඳ අධ්‍යාපනය හා දැනීම ලබා දීමටත් ඔවුන් අතර ඒ දැනීම පතුරුවා හැරීමටත් ධෛර්යය දීම සහ ඒවා නඟා සිටුවීම පදනමේ ප්‍රධාන අරමුණු වූ අතර එම අරමුණු සාක්ෂාත්කර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තා සමඟ සැසඳීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය හා සියලු පුද්ගලයන්ගේ මූලික නිදහස පිළිපැදීමෙහිලා අන්තර් ජාතික අවබෝධය යන අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍යවන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) පොදු ජනයාට සමාජ ප්‍රගතිය පිළිබඳ අධ්‍යාපනය හා දැනීම ලබා දීමට හා ඒ දැනීම ප්‍රචලිත කිරීමටත් ධෛර්යය දීම සහ ඒවා නඟා සිටුවීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ අංශ 05 ක් මගින් ඩිප්ලෝමා පාඨමාලා 41 ක්, සහතික පත්‍ර පාඨමාලා 45 ක් හා වැඩමුළු 47 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් ප්‍රගතිය සළකා බැලීමේ දී ඩිප්ලෝමා පාඨමාලා 25 ක්, සහතික පත්‍ර පාඨමාලා 27 ක් හා වැඩමුළු 46 ක් පවත්වා නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම කාලානුරූපීව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීම නිසා වැඩමුළු 8ක්, ඩිප්ලෝමා පාඨමාලාවක්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා වූ පුහුණු වැඩසටහනක් සහ කලා හා චිත්‍රපට විද්‍යායතන අංශය (Digital Film Academy and tv) මගින් වැඩසටහන් 6 ක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ වැඩසටහන් 16 ක් සමාලෝචිත වර්ෂයේ දී පවත්වා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පදනම මත සේවය කළ පෙර දැනුම් දීමකින් තොරව සේවයෙන් ඉවත් වූ අධ්‍යක්ෂවරයෙකුගෙන් අයවිය යුතු වැටුප් සහ අනෙකුත් අයවීම් රු.283,989 ක් 2006 වර්ෂයේ සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පෙර දැනුම් දීමකින් තොරව සේවය හැර ගිය සේවකයින් 14 දෙනෙකුගෙන් අයවිය යුතු වැටුප් සහ අනෙකුත් දීමනා එකතුව රු. 504,116 ක් හා එම සේවකයන්ගෙන් 4 දෙනෙකුට ලබා දී ඇති උත්සව අත්තිකාරම්වලින් අයවිය යුතු රු. 23,750 ක් ද අයකරගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් විසින් පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වැඩමුළුවක් පැවැත්වීම සඳහා පදනම වෙත රු.3,653,000 ක් ලබා දී තිබුණු අතර වැඩමුළු පැවැත්වීමකින් තොරව උපදේශකවරු 06 දෙනෙකුට රු.3,600,000 ක් ගෙවා තිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය පැවරුම් පදනම මත සේවය කළ සේවකයෙකුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව පදනමට එරෙහිව පවරා තිබූ නඩුවක් සඳහා අධිකරණය ලබා දී තිබූ තීන්දුවකට අනුව සමාලෝචිත වර්ෂයේදී රු.120,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ඉදිකිරීම සිදු කිරීමේදී පදනමේ ශබ්ද වාහිනී යන්ත්‍රවලට හානි සිදුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඒවා අළුත්වැඩියාව සඳහා වැය කරන ලද රු.430,465 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට 2016 අගෝස්තු 22 දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල්, මැයි සහ ජූනි මාසයන්හි දී නේවාසිකාගාරයේ ද්විත්ව කාමරයක් ගාස්තු අය කිරීමකින් තොරව දින 40 ක් බාහිර පාර්ශවයන් වෙත නවාතැන් සඳහා ලබා දී තිබීම නිසා රු.158,520 ක ආදායමක් අහිමි වී තිබුණි.

**4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

ප්‍රධාන ගොඩනැගිල්ලට වර්ග අඩි 24,000 ක් අළුතින් එකතු කිරීම සඳහා වූ රු.48,674,388 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2015 මාර්තු 11 දින නිමකර භාරදිය යුතුව තිබුණි. එසේ වුවද ගිවිසුමේ කාලය දීර්ඝ කරවා නොගෙන දින 239 ක ප්‍රමාදයකින් පසුව 2015 නොවැම්බර් 05 වන දින ඉදිකිරීම් නිමකර භාර දී තිබුණද කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 ඡේදය ප්‍රකාරව රු. 4,867,439 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක ශ්‍රේණියේ තනතුරුවලින් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් පුරප්පාඩුවී පැවතීම හේතුවෙන් ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම කෙරෙහි බලපෑමක් ඇති වී තිබුණි.

(ආ) 1993 වර්ෂයෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ බඳවා ගැනීම් පරිපාටියක් නොතිබූ අතර, බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කිරීම සඳහා 2014 හා 2016 වර්ෂවල දී අත්තිකාරම් වශයෙන් උපදේශකවරුන් තිදෙනෙකුට රු. 550,000 ක් ගෙවා තිබුණද විගණිත දිනය වූ 2016 සැප්තැම්බර් 30 දක්වාම බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 විගණන කමිටු**

2010 දෙසැම්බර් 03 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 15 වන වගන්තිය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ණයගැති පාලනය | ණය අය කර ගැනීම ප්‍රමාද වීම. |
| (ආ) කාර්යමණ්ඩල පරිපාලනය | (i) බඳවා ගැනීමේ පරිපාටියක් සකස් නොකිරීම.<br>(ii) පෞද්ගලික ලිපිගොනු ක්‍රමානුකූලව පවත්වා නොතිබීම.<br>(iii) බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී අවම සුදුසුකම්, සේවා පළපුරුද්ද හා වයස් සීමාව නිර්නය කර නොතිබීම හා ගෙවිය යුතු ගාස්තු තීරණය කර නොතිබීම.<br>(iv) ස්ථිර කථිකාචාර්යවරුන් විසින් අධ්‍යයන කටයුතුවල යෙදිය යුතු අවම කාල සීමාවන් නිර්ණය කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) ආදායම් පාලනය | (i) | නේවාසිකාගාර ආදායම් නිවැරදිව ගණනය නොකිරීම. |
| | (ii) | ණය පදනම මත ශ්‍රවණාගාර හා නේවාසිකාගාර පහසුකම් සැලසීම. |